**ශීර්ෂය 110 - අධිකරණ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 110 - අධිකරණ අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුලි 11 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2** ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2.** **ගිණුම්**

---

**2.1** **විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 874.76 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 774.39 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 100.37 ක් හෙවත් සියයට 11.47 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 764.22 | 685.85 | 78.37 | 10.25 |
| මූලධන | 110.54 | 88.54 | 22.00 | 19.90 |
| **එකතුව** | **874.76** | **774.39** | **100.37** | **11.47** |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 11001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම |  | ලැබීම් |  | හර ශේෂය |  |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 21.0 | 14.5 | 7.2 | 47.8 | 75.0 | 41.7 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය යටතේ 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. මිලියන 2.6 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
|  | රු.මිලියන |
| 6000/0000/00/0016/0086/000 | 2.3 |
| 6000/0000/00/0013/0093/000 | 0.3 |
| එකතුව | **2.6** |

## 2.4 විගණන නිරීක්ෂණය

අධිකරණ අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3.** **ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

3.1 **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (i) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (ii) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (iii) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454 (2) |
| (iv) | ණය සහ අත්තිකාරම් ලේඛනය | 1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය |

**3.2** **රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 11001 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.2,678,797 ක් වූ අතර, 2016 ජුනි 30 දින වන විටත් ඉන් රු.1,748,014 ක ණය ශේෂ අය කරගෙන තිබුණි. ඒ අනුව වර්ෂ 1 ක සිට වර්ෂ 24 ක් දක්වා කාල පරාසයක සිට පැවත එන එකතුව රු.930,783 ක්වූ හිඟහිටි ණය ශේෂ 2016 ජුලි 15 දින වන විටත් අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**3.3** **වත්කම් කළමනාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා 2016 ජුලි 12 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**3.4** **අනුකූල නොවීම**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනකූල නොවූ

අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | | **වටිනාකම** | **අනුකූල නොවීම** |
| --- | --- | --- | --- |
| | | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| (අ) | XII වැනි පරිච්ඡේදයේ 14 වන වගන්තිය | 2,171,887 | අතිරේක ලේකම් (නීති) නිලධාරිණියේ වැටුප් රහිත අධ්‍යයන නිවාඩු අනුමත කර තිබුණත්, පසුව ආයතන සංග්‍රහයේ විධිවිධානවලින් බැහැරව කටයුතු කර එම නිවාඩු වැටුප් සහිත නිවාඩු ලෙස සලකා වැටුප් ගෙවා තිබුණි. |
| (ආ) | XII වැනි පරිච්ඡේදයේ 16.9 වගන්තිය | - | වැටුප් රහිත නිවාඩු ලබා සිටින නිලධාරියෙකු එකී නිවාඩු කාලය තුළ ඇති වන්නාවූ කිසිදු පුරප්පාඩුවකට උසස් කිරීම සඳහා සලකා බැලිය යුතු නොවූවත්, සහකාර ලේකම් (නීති) ලෙස කටයුතු කර නොතිබුණ නිලධාරිනිය වැටුප් රහිත නිවාඩු කාලය තුළ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (නීති) තනතුරත් අතිරේක ලේකම් (නීති) තනතුරත් සඳහා උසස්වීම් ලබා තිබුණි. |

## 3.5 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය පිහිටුවීම ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 06 වන මහල වෙනුවට 22 වන මහලට ගෙනයාම නිසා රු.5,395,488 ක වැඩිපුර කුලීයක් ගෙවා තිබුණි.

(ආ) ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබුණි. එම ගොඩනැගිල්ල වෙනුවෙන් මාස 36 ක කාලයක් සඳහා කුලිය ලෙස රු.69,404,229 ක්ද, සේවා ගාස්තු ලෙස රු. 14,436,576 ක්ද, වශයෙන් රු.83,840,805 ක් පුද්ගලික සමාගමකට ගෙවා තිබුණි. එම ගොඩනැගිල්ලෙන් අමාත්‍යාංශය විසින් කිසිදු සේවාවක් ලබා ගෙන නොතිබුණි.

## 3.6 කාර්යසාධනය

අමාත්‍යාංශය යටතේ පවතින දිස්ත්‍රික්ක 25 ක සමථ මූල මණ්ඩල 329 ක් සඳහා 2015 වර්ෂය තුළ ලැබී තිබූ ආරවුල් සහ එම ආරවුල් සමථයකට පත්කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 2015 ජනවාරි 01 දිනට සමථ කිරීම සඳහා පැවති ආරවුල් සංඛ්‍යාව | | 86,297 |
| සමාලෝචිත වර්ෂය තුළ සමථ කිරීම සඳහා ලැබී තිබූ ආරවුල් සංඛ්‍යාව | | 144,783 |
| | | ---------- |
| සමථ කිරීමට නියමිත මුලු ආරවුල් සංඛ්‍යාව | | 231,080 |
| අඩු කළා | | |
| පාර්ශවකරුවන් නොපැමිණීම මත ඉවත් කළ ආරවුල් සංඛ්‍යාව | 5,959 | |
| ප්‍රතික්ෂේප කරන ලද ආරවුල් සංඛ්‍යාව | 61,065 | |
| ඉල්ලා අස්කර ගන්නා ලද ආරවුල් සංඛ්‍යාව | 5,663 | (72,687) |
| | | ----------- |
| සමථ මූලයන් තුළ සමථ කළ හැකි ආරවුල් සංඛ්‍යාව | | 158,393 |
| 2015 වර්ෂය තුළ සමථ කළ ආරවුල් සංඛ්‍යාව | | (59,961) |
| 2015 දෙසැම්බර් 31 දිනට තවදුරටත් සමථ කිරීමට තිබූ ආරවුල් සංඛ්‍යාව | | 98,432 |
| | | ====== |

සමථ මූල මණ්ඩල 329 ක් සඳහා සමථ කිරීමට නියමිත තිබුණු ආරවුල් මුලු සංඛ්‍යාවෙන් සියයට 37.8 ක් පමණක් නිරවුල් කර තිබුණි.

## 3.7 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යා ව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 34 | 24 | 10 | - |
| (ii) | තෘතියික මට්ටම | 10 | 08 | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 176 | 163 | 22 | 09 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 113 | 76 | 37 | - |
| | **එකතුව** | **333** | **271** | **71** | **09** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ද්විතීයික මට්ටමට අයත් සංවර්ධන නිලධාරි තනතුරු 07 ක්ද, සංවර්ධන සහකාර තනතුරු 02 ක්ද, වශයෙන් තනතුරු 09 ක් අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා අතිරික්තව පැවතුණි. එම අතිරික්ත කාර්ය මණ්ඩලය සඳහා විධිමත් අනුමැතියක් ලබා ගැනිමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) පුස්තකාලයාධිපති තනතුර වසර කිහිපයක සිට පුරප්පාඩුව පැවතීමෙන් පුස්තකාල පොත් පරිහරණය කිරීමේදී නිලධාරීන්ට මහත් අපහසුවක් වී තිබුණි. නීති විෂයයන්ට අදාල ඉතා වටිනා පොත් 3,125 ක් මෙම පුස්තකාලයේ පවතින බව පරිග්‍රහණ ලේඛනය අනුව නිරීක්ෂණය විය. මේ අනුව පුස්තකාලය භාරව නිලධාරියෙකු නොමැති වීම එම සම්පත් පරිහරණයට බාධාවක් වී තිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩල තොරතුරුවලට අනුව ජලනල කාර්මික තනතුරු 06 ක්ද, විදුලි කාර්මික තනතුරු 05 ක්ද, පෙදරේරු තනතුරු 05 ක්ද හා වඩුකාර්මික තනතුරු 05 ක්ද පුරප්පාඩුව පැවතිණි. එහෙත් දැනට අමාත්‍යාංශයේ පවතින ගොඩනැගිලි නඩත්තු කිරීම් හා වැඩිදියුණු කිරීමේ කටයුතු උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය මගින් සිදුකර තිබුණු බැවින් මෙම තනතුරුවල පුරප්පාඩුව අමාත්‍යාංශයේ කාර්යයන් ඉටු කිරිම කෙරෙහි බලපා නොතිබුණි.